

# ඔබ

# බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ගනුදෙනුකරුවෙක්ද?

**එසේ නම්,**

ඔබ ව්‍යාපාරික සබඳතාවයක් ආරම්භ කරන අවස්ථාවේදී හෝ ඔබේ තොරතුරු වරින් වර සමාලෝචනය කරන අවස්ථාවේදී හෝ ඔබේ බැංකුව හෝ මූල්‍ය ආයතනය ඉල්ලා සිටින පහත තොරතුරු සපයන්න.

- ඔබේ සම්පූර්ණ නම
- ඔබේ ඡායාරූපය ඇතුළත් නිල පෞද්ගලික හැඳුනුම්පත හෝ වෙනත් යම් හඳුනාගැනීමේ ලේඛනයක් (උදා: ජාතික හැඳුනුම්පත, වලංගු ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය)
- ඔබේ ස්ථිර ලිපිනය සහ ලිපිනය තහවුරු කිරීමේ ලේඛනයක්
- ඔබේ දුරකතන අංකය
- ඔබේ උපන්දිනය සහ ජාතිය
- ඔබේ රැකියාවට අදාල විස්තර
- ඔබ ගිණුම ආරම්භ කිරීමේ අරමුණ
- ඔබේ අපේක්ෂිත මාසික පිරිවැටුම/ ව්‍යාපාර ධාරිතාවය
- ඔබ ගනුදෙනු කිරීමට අපේක්ෂිත ආකාරය (උදා: මුදල්, චෙක්පත් ආදිය මගින්)
- ඔබ මුදල් උපයාගත් ආකාරය

එසේම ඔබ ලබා දුන් ඉහත තොරතුරු වල යම් වෙනස්කමක් සිදුවුවහොත් එය දැනුම් දීමද ඔබ සතු යුතුකමකි.

බැංකු සහ මූල්‍ය ආයතන ඔවුන් ලබා දෙන සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හා මූල්‍ය අපරාධ අවදානමෙන් රට ආරක්ෂ කරගැනීම සඳහා නීතිමය අවශ්‍යතාවලට අනුකූලව ඔබේ තොරතුරු රැස් කරයි.

ඔබ, ඔබේ බැංකුව හෝ මූල්‍ය ආයතනය සමඟ සහයෝගයෙන් කටයුතු නොකරන්නේ නම්, ඔවුන් ඔබ සමඟ කිසිදු ව්‍යාපාරික සම්බන්ධතාවයක් ඇති කර ගැනීම ප්‍රතික්ෂේප කිරීමට හෝ ඔබ සමඟ කිසිදු ගනුදෙනුවක් සිදු නොකිරීමට හෝ ඔබ සමඟ පවතින ව්‍යාපාරික සම්බන්ධතාවය අවසන් කිරීමට හෝ ඉඩ ඇත.

මූල්‍ය අපරාධවලින් ආරක්ෂා වීමට හා කාර්යක්ෂම මූල්‍ය සේවාවන් සඳහා පහසුකම් සැලසීමට ඔබේ බැංකුව හෝ මූල්‍ය ආයතනය ඉල්ලා සිටින තොරතුරු ලබාදෙමින් ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම ඔබගේ වගකීමයි.

එබැවින්, මේ සඳහා ඔබගේ සහයෝගය ඉල්ලා සිටිමු.

**මේ පිළිබඳ වැඩි විස්තර සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද "2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිලිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති" වෙත යොමු වීමට මෙම QR කේතය ස්කෑන් කරන්න.**


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මූල්‍ය බුද්ධි ඒකකය
நிதியியல் உளவறிதல் பிரிவு
FINANCIAL INTELLIGENCE UNIT

අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01

☎ 0112477125 | Fax 0112477692 | @ fiu@cbsl.lk | www.fiusrilanka.gov.lk